( 15 )

# නුවරකලාවියේ ජන ජීවිතය හා බැඳුණු වැහි බලිය හෙවත් හෙළුවැලි බලිය පිළිබඳ මානවවංශ පුරාවිද්‍යාත්මක විමසුමක්.

කසුන් රුහිරු මධුසංක
තෙවන වසර
kasun.ruhiru@gmail.com

**හැඳින්වීම.**

මිනිසා සිය පරිණාමීය ගමන් මඟෙහි දී කාලානුරූපී ව භෞතික, සමාජීය හා සංස්කෘතික යන ප්‍රවේශයන් ඔස්සේ පරිණාමය වන්නට විය (Darwin 1959). එම කාලය තුළ කාලනුරූපී විපර්යාසයන් සමඟ ජීවත්වන පරිසරයේ වපසරිය ක්‍රමයෙන් වැඩි කරගන්නට ද විය (Deraniyaala 1992). මෙම ව්‍යාප්තියත් සමග ලෝකයේ බොහෝ ප්‍රදේශයන්හි යාතුකර්ම, අභිචාර විධි හා කෙම්පහන් ක්‍රම ඔවුනොවුන්ගේ සංස්කෘතියට අනුව මෙන් ම ආගමික විශ්වාසයන් හා ඇදහිලි මූලික කොට ගෙන ද ආරම්භ වී ව්‍යාප්තව ඇත. ඉංග්‍රිසි භාෂාව තුළ ඔෆරින්ග් (OFFERING) නැතහොත් සැක්‍රිෆයිස් (SACRIFICE) ලෙසින් කියැවෙන වචනයෙන් ,පූජාව, යන සිංහල වචනයට තවත් සිංහල පර්යාය පදයක් පවතී. එනම් ,බලිය, යන්නයි. බලිය යන්නෙහි ප්‍රධාන අර්ථය ,පූජාව, වෙයි. බ්‍රාහ්මණ ග්‍රන්ථ වල මෙන්ම උපණිෂද් ග්‍රන්ථ වල ද මේ අර්ථ දෙකෙන් ම බලි යන්න විග්‍රහ කර ඇත (සේදරමන් 1964). වෛදික සාහිත්‍යයේ මෙන් ම බෞද්ධ පාලි සාහිත්‍යයේ ද බලි යන පදය පූජාර්ථයෙන් ව්‍යවහාර වී තිබේ (කාරියවසම් 2003). නමුත් මෙරට අභිචාර විධි තුළ පැමිණෙන බලි උපත හා විකාශනය පිළිබඳ විමසීමේ දී, ක්‍රි.පූ. හතරවන ශතවර්ෂයේ පණ්ඩුකාභය දා පටන් ශාන්තිකර්ම පැවතුන බවට මහා වංසය මූලාශ්‍ර සාධක සපයයි. එම මූලාශ්‍රයෙහි සඳහන් පරිදි චිත්තරාජ , කාලවේල, වලවා මුඛී යන යක්ෂයින් වෙනුවෙන් ආරාම හා ඔවුන්ට බලි පූජා පැවැත්වූ බව පෙනේ.

"..වලවාමුඛී යකින් රජ් ගෙවුයන් ...උන්ට ද අන්‍යයන්ට ද අවුරුදු පතා බලි දානය කරවී නකත්..''(මහාවංශය 1996).

ඉන් වසර ගණනකට පමණ පසු පුලතිසිපුර රජු වූ නිශ්ශංකමල්ල රජ තුමන් නවග්‍රහයන් උදෙසා පැවැත් වූ ග්‍රහ පූජාවක් පිළිබඳ ශිව දේවාල පුවරු ලිපියෙන් පැහැදිලි ය. එමෙන් ම දෙවන පරාක්‍රමබාහු රජු කර වූ දඹදෙණි කතිකාවතේ ,උපන් රෝගය නිසා බලි බත් කියවීම ආදී නොසරුප් කටයුතු නො කළ යුතු ය, ලෙස පැමිණේ. පසුකාලීන ව මහනුවර රජු සමයේ එලදැත්ත ගමේ සිරකරුවකු ව සිටි රොබට් නොක්ස් විසින් ද ග්‍රහයින් සඳහා පැවැත් වූ බලියාග පිළිබඳ සඳහන් කරයි (කාරියවසම් 2003). මේ අනුව පෙනී යන්නේ මෙරට අතීතයේ සිටම බලියාග පැවති  බවයි. මෙකී බලියාගයන් ගේ අවශේෂයන් වර්තමානයේ ද නුවර කලාවියේ ජනයා අතර දැක ගත හැකි ය.

නුවර කලාවිය යනු නුවර වැව, කලා වැව, පදවිය වැව යන ඉපැරණි වාරි කර්මාන්තයන්ගෙන් පෝෂණය වූ ප්‍රදේශයයි. මෙම ප්‍රදේශයෙහි පැවති ශාන්තිකර්ම ක්‍රමවේදයන් වර්තමානයේ අප අතරින් වියැකෙමින් පවතී. ඇතැම් බලි ශාන්තිකර්ම දැනට ද භාවිතයෙන් තොර ය. නුවර කලාවියේ පැවති වැසිබලිය නම් බලි ශාන්තිකර්මයට ද අත් ව ඇත්තේ එකී තත්වය ම ය. මෙසේ වියැකෙමින් පවතින වැසිබලිය මානවවංශ විද්‍යාත්මකව මෙන් ම පුරාවිද්‍යාත්මක වටිනාකමක් ද උසුලයි. පැරැන්නන්ගේ දැනුම, අභිචාර විධි හා විශ්වාසයන් මෙම බලිශාන්තිකර්මය තුළ ගැබ් ව ඇති බවක් පෙනෙන්නට ඇති අතර එබැවින් මෙම ශාන්තිකර්මය අස්පෘශ උරුමයක් (Intangble heritage) ලෙස ද වැදගත් වේ. එමෙන්ම මෙම වැසි බලිය තුළ දී මානව කෘති ද නිර්මාණය වේ. එබැවින් මේවා තුළ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ද තිබිය හැක. එබැවින් එහි මානව විද්‍යාත්මක සුවිශේෂතා හඳුනා ගැනීම මෙන්ම උරුම අගයන් හඳුනා ගැනීම ද එහි පුරාවිද්‍යාත්මක අගයන් හඳුනා ගැනීම ද අවැසි ය.

නුවර කලාවියේ බලිශාන්ති කර්ම පිළිබඳව විමර්ශනය කරන මෙම පත්‍රිකාව තුළින් නුවර කලාවිය ආශ්‍රිත ව පවතින වැසිබලිය හා හෙළුවැලි බලිය සම්බන්ධ විවිධ මානව ක්‍රියාකාරීත්වයන් පදනම් කොට මෙම පර්යේෂණය කරන ලදී. ඉතිහාසය හා පුරාවිද්‍යාව ඈදී අතීත ගවේෂක විෂය ප්‍රපංචයන්හි අනුශාංගික කාලානුරූප සමාජ වටිනාකම් හා නිර්ණායකයන් අධ්‍යයනය කළ හැක්කේ එකී සමාජය විසින්ම ගොඩනගන ලද දැනුම පද්ධතියෙන් හා ජනශ්‍රැතියෙන් ය. එබැවින් මෙකී අධ්‍යයනය සඳහා ප්‍රථමයෙන් පොත පත ඇතුළු මුද්‍රිත ලිපි ලේඛන අධයයනය කිරීම හෙවත් පුස්තකාලීය අධ්‍යයනය මෙහි පළමු ක්‍රමවේදය විය. එමෙන් ම පාරම්පරික දැනුම ගවේශණයේ දී එකී දැනුම සොයා ගැනීමට නම් අදාළ සමාජ ප්‍රපංචය තුළින්ම සෙවිය යුතු බැවින් ප්‍රශ්නාවලි ඇසීම ආදී ක්‍රමවේද තුළ පර්යේෂණ සඳහා ක්‍රමවේදය සකස් කරගන්නා ලදී.

**සාකච්ඡාව**

පාරම්පරික දැනුම විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ කුඩා සමාජයක් තුළ හෝ කුඩා ජන කණ්ඩායමක් තුළ හෝ යම් නිශ්චිත ජන ප්‍රදේශයක විස්ථාපනය වී තිබෙන්නට පුළුවන. එහෙත් මෙකී දැනුම ඔවුනොවුන්ගේ උපයෝගීතාවය ට මිස පරපුරෙන් පසු යම්තාක් අභාවිත තත්වයට පත්ව ඇති බවක් ද පෙනෙන්නට ඇත. කෙසේ නමුත් ක්‍රමික ව වත්මන දක්වා පැමිණි ගමන් මගෙහි ලංකාවේ විවිධ ප්‍රදේශවල භාවිතා කෙරෙන සාම්ප්‍රදායික ශිල්පීය ක්‍රම අනුව බලි ශාන්තිකර්මය කොටස් පහකි. එනම්,

- උඩරට සම්ප්‍රදාය
- පහතරට සම්ප්‍රදාය
- සබරගමුව සම්ප්‍රදාය
- ඌව සම්ප්‍රදාය
- නුවර කලාවිය සම්ප්‍රදාය (අමරසිංහ2007).

මෙහි නුවර කලාවියේ ගොවිතැන හා බැඳුනු අභිචාර විධි රාශියක් හඳුනාගත හැකි ය. එහි දී කෙම්පහන් ක්‍රම, අයියනායක දෙවියන් උදෙසා කෙරෙන මුට්ටි නැමීම, කඩවර වැනි යකුන් උදෙසා කරන බත් මාලාව මෙන්ම නවග්‍රහ බලි, මල් බලි, ගුරුළු රාක්ෂ බලි මෙන්ම වැහි බලිය ද සුවිශේෂි වේ. නුවරකලාවියේ ප්‍රකට ශ්‍රී විෂ්ණු වර්ෂාධිපති බලියත්, හෙළුවැලි බලියත් වර්ෂාව ලබා ගැනීම පරමාර්ථකොට පවත් වන්නකි (දිසානායක 2007).

වැහි බලිය නම් බලියාගය සිදු කරනු ලබන්නේ වැසි නොමැති නියං කාල වකවානු වලදී ය. විවිධ ප්‍රදේශවල විවිධ බලියාග පැවතුණ ද වැහි බලිය උතුරුමැද පළාතට සුවිශේෂි බවක් පෙනෙන්නට ඇත. වැහි බලියේ ස්වභාවය පිළිබඳ කොල් මුර කාව්‍යය වල පැමිණෙන්නේ මෙසේ ය.

අහල ගං හතක ගවයෝ නැති වෙච්චී
පහළ වැවේ දිය පතුලට හිඳිච්චී
ඉහළ දෙවියන්ට මඩිතිය කැවිච්චී
අපල දෝස වැහි බලියෙන් ගෙවිච්චී
( සාකච්ඡාව 01 )

මෙහි දී පෙනෙනුයේ වැහි බලිය සඳහා අනෙක් බලියාග වල දී මෙන් ආතුරයකු නොමැති බව ය. ගම්වැසි සියලු දෙනා වෙනුවෙන් වැහි බලිය සිදු වූ අතර මෙහි වැහි බලිය යන නම යෙදී ඇත්තේ ද පුරාණ ගැමියා අතිනි. වැසි නොමැති ගොවිතැන් හේන් පාළුව පීඩාවට පත්වන ගැමියන් ගමේ දේවාලයේ කපුරාළ සමග දේවාලයට ගොස් දෙවියන් වෙනුවෙන් දුක් කන්නලවු කොට යාතිකා කරති. මෙහි දී මින්නේරි ගෙවි ජනපද වාසීන් මින්නේරි දෙවියන් උදෙසාත්, කලු දෑකඩ දෙවියන් උදෙසාත් කන්නලවු කරන අතර වැහි ගම්පල මුත්තාට කියා වැස්ස ලබාදෙන මෙන් ද නැතිනම් වැසි බලිය සූදානම් කරන බවට ද ආයාචනයක් කරනු ලබයි (සාකච්ඡාව 02). මෙහි දී පෙනෙනුයේ වැසි ලබාදෙන මෙන් ප්‍රාදේශිය දෙවිවරුන්ට ගැමියා කන්නලවු කරනු ලබුව ද වැහි ගම්පල මුත්තානම් දෙවියකු වැස්ස ලබා දීමට මූලික වන බව හෙවත් වැසි දෙවියා ලෙස කටයුතු කරනු ලබන බවට ගැමියා තුළ විශ්වාසයක් වූ බවයි. මෙම යාතිකාව කෙම්මුර දිනක සිදුකරනු ලබන අතර ඊළඟ කෙම්මුර දිනට ප්‍රථම වැසි ලබාදෙන ලෙස ඉල්ලා සිටී. මෙහි දී වැවෙහි මැරුණු කුඩ මත්ත්‍ස්‍යයකුගේ ඔළුවක්, කැකුණ ගෙඩියක්, පඬුරුලක් දේවාලයෙහි එල්ලති. මෙය රහසින් කරන කටයුත්තක් බව ද එමගින් වර්ෂාව ලැබෙන බව ද පුරාණ ගැමියා විශ්වාස කර ඇති බවක් පෙනේ. වැසි ලැබුනහොත් පෙර බලි යාගය හෙවත් පූජාව සිදු කරයි. මෙහි දී දේව ආභරණ අහස් දියෙන් ම සෝදා දේවාලයෙහි කිරි ඉතුරුම් මංගල්‍යය සිදු කරයි. එහි දී මින්නේරි, කලුදෑකඩ, හුරුළු මහ දෙවි, කඩවර, පුල්ලෙයාර්, ගමේ දෙවි, කම්බිලි ආදී දෙවියන් උදෙසා ද බහිරව ඉලන්දාරී, කලු දේවතා පස් කට්ටුව ද පත්තිනි හා කාලි යන දෙවියන්ට බුලත් මල් යහන් තබයි. නමුත් කෙම්මුර දිනට ප්‍රථම වැසි නො ලැබුනහොත් වැහි බලි යාගය ම සිදුකරනු ලබයි. එහිදී දෙවියන් උපහාසයට හා හාසයයට ලක්කිරීම සිදුකරයි.

සුද්ද ලෙසට අඩුක්කුගති මේ ගමෙ මහ දෙයියෝ
නින්දගමේ වන් විපතට පිටු පෑවද දෙය්යෝ
බැද්දෙ රාළ අමුඩ කොටේ ගලවාගෙන අයියෝ
සද්දනොකර වහං උනයි වැහි ගම්පල දෙයියෝ.

(සාකච්ඡාව 01).

මෙහි දී වැහි බලිය තුළ ඒහා බැඳී පැමිණෙන හෙළුවැලි බලිය සිදුකොට ඇත්තේ විවිධ ප්‍රදේශයන් තුළ එම ප්‍රදේශයට ආවේණික ක්‍රමයකට ය. එය ගම් පෙදෙසින් පෙදෙසට වෙනස් බවක් පෙන්නුම් කරයි. මෙම අධ්‍යයනය තුළ දී හෙළුවැලි බලිය නම් බලි විශේෂය පවත්වන ආකාර දෙකක් හඳුනා ගැනීමට හැකි විය. එය එකිනෙකට යම් අවස්ථාවන් හි වෙනස් බවක් පෙන්නුම් කරයි.

අළුත් හුඹස් මැටියෙන් ස්ත්‍රී පුරුෂ ලෙස වෙන වෙන ම දේව රූප දෙකක් අඹන අතර එම රූප නිර්වස්ත්‍ර ව අඹනු ලබයි. මෙම බලි රූ ද්විත්වය බිම් කළුවර වැටෙන යාමයේ වැව් පිටියට රැගෙන යන අතර මෙහි දී මෙම බලිය සඳහා වැඩිහිටි පුරුෂ පාර්ශවය පමණක් සහභාගි වේ. නිරුවත් බලි රූ වැව් පිට්ටනියෙන් තබා බලියට ගිය සියල්ල නිර්වස්ත්‍රව නටා ගයා නොසරුප් කාව්‍යය කියති. හිතු මතේට ශබ්ද තාල නගා හූ කීම, උරුවම් බෑම වැනිදේ ද කාමය හා දෙවියන්ට අපහාස වන දේ ද කියති. තුන් රාත්‍රි පුරාවට සිදු කරන මෙම බලිය හිමිදිරියේ ඇටිකුකුළා බුක් ගානා පැයේ දී නිමවන අතර මැටි බලි රූ වැව් පිටියේ දමා පැමිණේ. මෙහි දී මෙම අපහාසාත්මක මැටි රූප ගම්වැසියන් දකීවි යැයි සිතා මැටි රූ දිය වී යන්නට මහා වර්ෂාවක් වස්සන බවට ගැමියන් විශ්වාස කරයි (සාකච්ඡාව 01).

වැසි නොමැති කළ කපුරාළ ගමේ පුරුෂයන් රැස් කර බලියට දිනක් නියම කර ගනී. රාත්‍රී කාලයේ වැඩිහිටි පිරිමින් සංහිඳට එකතුව සියල්ල නිරුවත් වෙති. අනතුරුව දේව රූප කඹ වලින් ගැට ගසා විවිධ ශබ්ධ නගමින් යාතිකා කවි මෙන්ම නො සරුප් දේ කියමින් දේව රූ බිම ඇදගෙන වැව් පිටියට යයි. දේව රූ මඩේ දමා පාගයි. එම පිළිම මතම  අඟ පසඟ විරූපීව දක්වා මැටි බලි අඹයි. විවිධ කවි කියමින් උපහාස කරයි.

මලේ බඹරු ලෙස පිරිවර ලැබුණයි පෙර කාලේ
ජලේ ගසා පීනා යති නාඹරයන් එකලේ
බලේ කොයිද වළං තැලිව හිඳලා වැව් පතුලේ
කුලේ බලේ නහ ගත්තයි වැව් ගම්පල රාළේ,

(සාකච්ඡාව 02)

මෙහි දී මෙම බලිය නැරඹීම හෝ සහභාගී වීම කුඩා දරුවන්ට හා කාන්තාවන්ට අකැප ය. ඇටි කුකුළා බුග් ගානා තෙක් මෙම බලි යාගය සිදුකරන අතර දේව රූ වැව් පිටියේ දමා පිරිස් නිවෙසට යයි. මෙම බලියෙන් පසු රාත්‍රියේ කළ මෙම බලිය පිළිබඳ එකිනෙකා කතා කිරීම තහංචි වී ඇත. වැව් පිටියට පැමිණෙන කිසිවකු දේව රූප ඇල්ලීම හෝ මඩ සේදීම සිදු නො කරයි. දේව රූ යැයි නො තකා කාන්තා පිරිමි සියල්ල ම රූප උඩින් පැන ගොස් අපහාස කරයි.

මෙහිදී ලැජ්ජාවට පත් දෙවියන් ම වැස්ස වලාහක දෙවියන්ට සැල කර මඩ සොදා ගන්නා බවට හෙළුවැලි බලිය නටනා ගැමියන් විශ්වාස කරයි. වැසි ලැබීමෙන් අනතුරුව දෙවියන් ඒ වැසි දියෙන් ම සෝදා යාතිකා මැද දේවාලයට වැඩමවා ඉදිරි කන්නයේ වැහි වරුසාවෙන් බත බුලත සරුවී ආදායම්ගත් පසු කිරි ඉතුරුම් මංගල්‍යය හා පෙරහර ඉටුකරන බවට ද මුට්ටි නැවුම් මංගල්‍යය කරනා බවට ද යාතිකා කොට පඬුරු බැඳීමෙන් වැහි බලිය අවසන් වේ (සාකච්ඡාව 02).

මේ අනුව පෙනෙන්නේ පැරණි ගැමියන් තම අවශ්‍යයතා අනුව විවිධ බලි යාග පැවැත්වූ බව ද ඒ තුළින් තම භවභෝග සම්පත් වැඩිකර ගැනීමට මෙන් ම ඒවා රැක ගැනීමට ද යම් ආකාරයක පිටුවහලක් නො පෙනෙන බලවේගයන් ගෙන් අපේක්ෂා කළ බවක් පෙනේ.

**නිගමනය.**

විවිධ බලි යාග පිළිබඳ බොහෝ ඇදුරන් දැන සිටිය ද වැහි බලිය හා එහි ම දිගුවක් වන හෙළුවැලි බලිය පිළිබඳ දැනුම යම් ප්‍රදේශයකට පමණක් සීමා වී ඇති බවක් පෙනෙන්නට ඇති අතර එම දැනුම වර්තමානයේ අභාවයට යන බවක් දැකගත හැකි ය. මෙරට දැකිය හැකි අනෙක් බලි යාග වල මෙන් ගැඹුරු පිළිවෙත් ක්‍රමයක් හා ක්‍රියා පටිපාටියක් මෙම බලියෙහි දක්නට නැත. වැහි බලිය පමණක් නොව බොහෝ පාරම්පරික අස්පෘෂ්‍යය උරුමයන් ගැමියා සතුවන අතර බලියාග හා බැඳුණු වත් පිළිවෙත්, මන්ත්‍ර, චාරිත්‍ර ක්‍රම ආදී දෑ පාරම්පරිකව ලද දැනුමේ එකතුන් හි අවශේෂයන් ලෙස හඳුනා ගත හැකි ය. එබැවින් අස්පෘෂ උරුමයක් ලෙස හඳුනා ගත හැකි වන මෙම බලියාගය අභාවයට යන පුරාණ සාම්ප්‍රදායික උරුමයක් ලෙස ආරක්ෂා කිරීම පුරාණ සමාජ අනන්‍යයතාවයට වැදගත් පිටුවහලක් වේ. එමෙන් ම මෙම වැසි බලිය තුළ දී අස්පෘෂ උරුමය මෙන් ම මානව කෘති ද නිර්මාණය වේ. වැසි බලිය තුළ දී නොපිළිස්සූ මැටි මානව රූ නිර්මාණය කරයි. මේවා පැරණි ගැමියන් වැව්පිටි වල දමාගොස් ඇත. පුරාවිද්‍යාව තුළ පුළුටු මැටි රූ හෙවත් ටෙරාකොටා ලෙස පැරණි නො පිළිස්සූ මැටි රූප හැඳින්වෙන අතර වැව් ආශ්‍රිත ව සිදුකරනු ලබන කැණීම් මගින් හමුවන මානවකෘති අතර මෙම ටෙරාකොටා ද තිබිය හැක. එබැවින් මෙමගින් නිර්මාණය කර තිබෙන මානවකෘති පුරාවිද්‍යාත්මක වටිනාකමක් ද උසුලයි. ඒ අනුව ගත්කළ මෙම වැසිබලිය අස්පෘෂ උරුමයක් ලෙස වටිනාකමක් උසුලනවා මෙන් ම ඒ තුළ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ද ගැබ් ව ඇත. එබැවින් මෙය පර්යේෂකයින්ගේ අවධානයට යොමුවිය යුතු ක්ෂේත්‍රයක් ලෙස ද පෙන්වා දිය හැක.

**ආශ්‍රේය මූලාශ්‍ර හා ලිපි නාමාවලිය**


අමරසිංහ ජයන්ත, 2007, ***ලංකාවේ බලි ශාන්තිකර්ම***, එස්.ගොඩගේ සහෝදරයෝ.

කාරියවසම් තිස්ස, 2003, ***බලියාග පිළිවෙළ***, ගොඩගේ සහ සහොදරයෝ.

දිසානායක මුදියන්සේ, 1996, ***දෙමල හත්පත්තුවේ ඇදහිලි විශ්වාස හා ශාන්තිකර්ම,*** ඇස්.ගොඩගේ සහෝදරයෝ.

***මහාවංශය***, 1996, බටුවන්තුඩාව දේවරක්ෂිත(සංස්) හික්කඩුවේසුමංගල හිමි, ඇස්. ගොඩගේ සහෝදරයෝ.

සේදරමන්. ජේ.ඊ, 1964 , ***බලියාග උපත***, ඇම්.ඩී.ගුණසේණ

සේදරමන්. ජේ.ඊ, 1967 , ***බලියාග විචාරය***, ඇම්.ඩී.ගුණසේණ

Darwin, C. 1859. ***The Origin of Species***. London: Murray.

Deraniyagala.S.U, 1992, ***The Pre history of Sri Lanka, part 1-2***, Archaeological Survey Department, Colombo


**සාකච්ඡා**

සම්මුඛ සාකච්ඡාව 01, ඒකනායකගේ හේරත් බංඩා (අ.වු 72) බටතුණ, පොලොන්නරුව,2016 ජනවාරි 20 දින දී,උදෑසන 11.05 ට පමණ,පැරණි බලි පිළිබඳ සාකච්ඡා කිරීමේ දී.

සම්මුඛ සාකච්ඡාව 02, මානප්පෙරුම මුදියන්සේලාගේ , (අ.වු. 64) අංක 23 දේවාල පාර මින්නේරිය, 2016 ජනවාරි 28, උදෑසන 11.05 ට පමණ, පැරණි බලි පිළිබඳ සාකච්ඡා කිරීමේ දී.